# 6
# වයඹ පළාතේ අයියනායක දෙවියන් ඇදහීම පිළිබඳ විශ්වාස හා පුදපූජා

**පියතිස්ස සේනානායක**

**හැඳින්වීම, අරමුණු හා පරමාර්ථ**

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් වැඩි ම පිරිස නියෝජනය වන්නේ සිංහල සහ දෙමළ යන ජන කණ්ඩායම් දෙකෙනි. සිංහල ජනතාව අතර අයියනායක යන නමින් ද දෙමළ ජනතාව අතර අයියනාර් යන නමින් ද වන්දනයට පාත්‍ර වන මෙම දෙවියෝ (හෙට්ටිආරච්චි 1963:755-757) වයඹ පළාතේ ගැමි ජනතාව අතර තවමත් බහුල ව පුදපූජා ලබන දෙවි කෙනෙකි. ශ්‍රී ලංකාවේ දකුණු පලාතේ ජනයා මෙම දෙවියන් ඇදහීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන බව පෙනේ. එහෙත් ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ වයඹ යන පලාත්වල ප්‍රාග් නූතන යුගයේ ජනතාවට මොහු විශේෂ දෙවි කෙනෙක් විය. සිංහල වේවා දෙමළ වේවා ඔවුන්ගේ එදිනෙදා ජන ජීවිතයත්, ජීවත්වීමේ මාර්ගයත් මෙම දෙවියන්ට හැම අතින් ම සම්බන්ධ වී තිබුණි. මෙම දෙවියන්ගේ පිහිට ආධාරය නොලැබුණොත් ඒ සියල්ල අසාර්ථක වන බව එදා ඔවුන්ගේ පිළිගැනීම විය. ඉහත කී පළාත්වලත් ඒ ඒ පරිසර කලාපයේ ස්වභාවය අනුව දෙවියන් හා මිනිසුන් අතර සහසම්බන්ධතාවේ විවිධ වෙනස්කම් එදා සහ අද පවත්නා බව පැහැදිලි ව පෙනේ. එහෙයින් මෙම දේව වන්දනය පිළිබඳ අධ්‍යයනය කිරීම මගින් සිංහල සහ දෙමළ යන දෙපිරිසේ ම ආකල්ප සිතුම්පැතුම් චර්යා රටා යම් ප්‍රමාණයකට අවබෝධ කර ගැනීමට හැකිවනු ඇත. ජනතාව අතර සාමය හා සංහිඳියාව තහවුරු කිරීමට අවශ්‍ය දෙපිරිසේ ම මූලික සමාජ පදනම හඳුනාගත හැකි වනු ඇත. එය නූතනයේ ශ්‍රී ලංකාව මුහුණපා සිටින බරපතල ම සමාජ අර්බුදයට කිසියම් විසඳුමක් සැපයීමෙහි ලා මහෝපකාරී වනු ඇත. එහෙයින් අයියනායක නොහොත් අයිනාර් දේව වන්දනය පිළිබඳ ව විධිමත් පර්යේෂණයක නිරතවීම කාලෝචිත බව අවධාරණය කළ හැකි ය (සේනානායක 2002). මෙහිදී මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ

වයඹ පළාතේ ජනතාව අතර පවතින අයියනායක දෙවියන් ඇදහීම පිළිබඳ විශ්වාස හා පුදපූජා පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

**ක්‍රමවේදය හා දුෂ්කරතා**

දත්ත ඒකරාශි කිරීම සඳහා පර්යේෂණ ක්‍රමවේද යටතේ පුස්තකාල සමීක්ෂණ, පුරාවිද්‍යා ගවේෂණ සහ මානවවංශ විද්‍යා අධ්‍යයන කටයුතු සිදුකරන ලදි. ප්‍රථමයෙන් ම පුස්තකාල සමීක්ෂණ ඇසුරෙන් මෙයට පෙර මේ මාතෘකාව පිළිබඳ ව කළ සියලු ම පර්යේෂණ දත්තයන් විමර්ෂණය කිරීම සිදුවිය. අයියනායක හෝ අයියනාර් දෙවියන් පිළිබඳ ව ලියැවුණු ඇතැම් පර්යේෂණ පත්‍රිකා හා ග්‍රන්ථ දෙමළ භාෂාවෙන් රචනාවී තිබූ නිසා ඒවා පරිහරණයකර දත්ත ලබාගැනීමේ දුෂ්කරතා මතු විය. එබඳු අවස්ථාවල දෙමළ භාෂාව පිළිබඳ ව ප්‍රමාණවත් දැනුමත් ඇති උගතුන්ගේ සහාය ලබාගැනීම අත්‍යවශ්‍ය විය. ඉන් පසුව පුරාවිද්‍යා ගවේෂණ මගින් සහ මානවවංශවිද්‍යා අධ්‍යයන මගින් ක්ෂේත්‍ර කටයුතු ආවරණය කරන ලදි. මෙම ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවල දී නිරීක්ෂණය වැදගත් ම ක්‍රමෝපාය ලෙස භාවිතයට ගැනිණි. එහිදීත් අයියනායක හෙවත් අයියනාර් බොහෝ දෙනාගේ පූජනීයත්යට භාජනය වී සිටින දෙවිකෙනෙකු නිසා සහභාගී නිරීක්ෂණය දත්ත ඒකරාශී කිරීමේ ක්‍රමවේදයේ ලා බොහෝ විට අනිවාර්ය අංගයක් විය. දෙවියන් පිළිබඳ ව ගෞරවය හා භක්තියක් නැති අයකු ලෙස තේරුම් ගතහොත් එබඳු අවස්ථාවන්හී දී ඇතැම් වාරණය කිරීම්වලට යටත් වීමට සිදුවිය හැකි ව තිබුණි. එබැවින් බොහෝ අවස්ථාවල මෙම අධ්‍යයනය කරනු ලබන්නේ දෙවියන් පිළිබඳ ව සැබෑ ගෞරවයකින් හා භක්තියකින් යුක්ත ව බව අදාළ අයට පෙන්වා කටයුතු කිරීමට සිදුවිය.

ඇදහිලි ක්‍රම සහ විශ්වාසයන් සමග බැඳී පවතින විෂයයක් නිසා කෙබඳු ක්ෂේත්‍ර ක්‍රමෝපායන් භාවිත කළ ද ඇතැම් තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතා පැවතුණි. එබදු අවස්ථාවල දී තම දෙනෙතින් බලා නිශ්චිත ව ම අවබෝධ කරගත යුතු ඇතැම් දේ දැක ගැනීමට අවස්ථාවක් නොලැබුණු බව කණගාටුවෙන් සඳහන් කළ යුතු ය. දෙවියන් සහ සමාජය අතර සම්බන්ධතාව ඇති කරන අතරමැදි පුද්ගලයන් වූ කපුමහත්වරුන් දේවාල භාරකරුවන් ආදීන් මත යැපෙන්නටත් ඔවුන් කියන දේ විමර්ශනයකින් තොරව භාර ගන්නටත් සිදු වූ අවස්ථා පැවතුණි. උදාහරනයක් ලෙස ඇතැම් දේවාලයක ගර්භ ගෘහය තුළට පිවිස සෑම දෙයක් ම නිරීක්ෂණය කරන්නටත්, ඒවා ඡායාරූප ගන්නටත් හැකි වූයේ නැත. ඇතැම් දේවස්ථානවල අභ්‍යන්තරයට පිවිසීම සපුරා තහනම් විය. ඇතැම් විටක පිවිසීමට අවසර ලැබුණත් ඡයාරූප ගැනීම තහනම් විය. එසේ ම බොහෝ විට ඇතුළට පිවිසීමට අවසර ලැබුණු තැන්වලත් ඒ අවසරය ලැබුණේ පුදපූජා නොපැවැත්වෙන බැතිමතුන්ගෙන් දේවාලය හිස්වී පවත්නා අවස්ථාවල ය. සැබවින් ම දේවාලය

සක්‍රීය ස්ථානයක් බවට පත්වන්නේ පුදපූජා පවත්වන බැතිමතුන් බහුල ව පැමිණෙන අවස්ථාවල දී ය. ඒ අවස්ථා දේවාලය ඇතුළට පිවිසී නිරීක්ෂණය කිරීමට ඉඩකඩ නොලැබීම බලවත් ම අඩුපාඩුවක් විය. මේ නිසා බොහෝ තැන්වල දී සජීවි ව ඒ ඒ පුදපූජාවල ස්වභාවය නිවැරදි ලෙස ම නිරීක්ෂණය කිරීමට නොලැබුණු බව සඳහන් කළ යුතු ය.

**අයියනායක දෙවියෝ**

ශ්‍රී ලංකාව තුළ අයියනායක දෙවියන් පිළිබඳ ව හමුවන සියළු ම ලිඛිත සාක්ෂි 14 වන සියවසට වඩා පැරණි නොවේ. පැරණි ම ලිඛිත මූලාශ්‍රයන් වන බ්‍රාහ්මී ලිපිවලත්, මහාවංසය සහ සමන්තපාසාදිකා ඇතුළු පාලි අට්ඨකථා, සීහළවත්ථුප්පකරණ, සහස්සවත්ථුප්පකරණ, මහාබෝධිවංස, ථූපවංස, වංසත්ථප්පකාසිනි ආදී පැරණි ම සාහිත්‍ය ග්‍රන්ථවලත් මෙම දෙවියන් පිළිබඳ ව කිසිදු තොරතුරක් ඇතුළත් ව නැත.

අයියනායක නමින් සිංහල භාෂාව කථාකරන ජනතාව අතර ද අයියනාර් නමින් දෙමළ භාෂාව කථා කරන ජනතාව අතර ද මෙම දෙවියන් ප්‍රකට ව සිටින බව ඉහත සඳහන් විය. ඒ හැරුණු විට මෙම දෙවියන් හැඳින්වීම සඳහා භාවිත වූ තවත් නම් ගණනාවකි. අයියනා, අයියනායක, අයියනාග, අයියනායක, අයියනාථ, අයියානායක, අයියනායගම්, අරියනායක, අරියනායග, අරියනායගන් යන නම් ද අයියන්, අයියනාරයන්, අයියනාරේ, කයියනාර්, අල්ලනායක, සාත්තන්, සාස්තා, මහා සාස්තා, හරිහර පුත්‍රයනු ඒවා ය. (චන්දජෝති හිමි 1954:128-129; ධර්මබන්දු 1962:95; අබේරත්න 1986:208 එඩ්මන්ඩ් 1993:9-105; දිසානායක 1996:17-36; සේනානායක 2002).

මේ සෑම නමක් ම භාවිත කරනු ලැබුයේ කිසියම් හේතුවක් ඇතිව බව ඒ ඒ නාමය හා බැඳුණු පුරාවෘත්තයක් අනුව පැහැදිලි වේ. විෂ්ණු දෙවියන්ගේ අත්ලෙන් උපන් නිසා ඔහුට අල්ලනායක යන නම ලැබුණු බව කියවේ. (පීරිස් 1964:270). ඒ නිසා ම ඔහු කෛයනාර් නමින් දෙමළ කථාකරන අය අතර ජනප්‍රිය විය. කෛයනාර් යන්නෙහි අර්ථය ද හස්තයෙන් උපන් තැනැත්තා යන්න බව කියැවේ (හෙට්ටිආරච්චි 1963:755). රූමත් කාන්තාවකගේ වෙස්ගත් විෂ්ණු දෙවියන් විසින් මවන ලද දරුවන් සත්දෙනා අතරින් මුලින් ම මැවූ දරුවා (වැඩිමහල් පුද්ගලයා) එනම් අයියා ඔහු වූ නිසා ඔහු නායකයා ලෙස සලකා ඔහුට අයියනායක නොහොත් අයියානායක යන නම ව්‍යවහාර කළ බව (ඔබේසේකර 1984:113-114) ප්‍රකට පුරාවෘත්තියකින් කියැවේ. මේ ආකාරයට මෙම දෙවියන් හැඳින්වීම සඳහා භාවිත වූ නම් පණහක් පමණ තිබුණු බව ප්‍රකාශ වේ. කතරගම සන්නසෙහි අයියනාරායන් යනුවෙන් ද කෝකිල සන්දේශයේ අයියන් නමින් ද ඔහු හඳුන්වා

තිබේ (හෙට්ටිආරච්චි 1963:755, 156; ගුණවර්ධන 1945:148). ශිව හා විෂ්ණුගේ පුත්‍රයකු වූ නිසා හරිහර පුත්‍ර යන නාමය ඔහුට හිමි විය. (ඕමැලි 1935:141-143). අයියනායක නාමයේ මුල් ස්වරූපය අරිය නායක නොහොත් ආර්ය නායක බව (සෝමානන්ද හිමි 1993:6; එඩ්මන්ඩ් 1993:99) තවත් මතයකි. ආර්ය නමින් හැඳින්වෙන්නේ ආර්ය භාෂා කථා කළ අය පමණක් නොවේ. මලය අර්ධද්වීපයේ සිට මෙහි පැමිණි අය ද ඒ නමින් හඳුන්වා තිබේ (පරණවිතාන 1986:24-25). අයියනායක මලල කුමාරවරු සමග පැමිණියකු බව වන්නි විත්තිය අවධාරණය කරන නිසා (අභයසිංහ 1960:107) මලලවරුන්ගේ නායකයා (ආර්ය නායක) යන අර්ථයෙන් ද අයියනායක යන නාමය භාවිත වන්නට ඇතැයි සිතීමට ඉඩකඩ තිබේ (සේනානායක 2002).

**දේවස්ථාන හා පුදපූජා**

වියළි කලාපයේ විශේෂයෙන් ම උතුර, උතුරුමැද සහ වයඹ යන ප්‍රදේශවල ඇති කුඩා වැව් අසල අයියනායක හෙවත් අයියනාර් දෙවියන් පුදන ස්ථාන නිතර ම දක්නට ලැබේ. දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවේ අයියනාර් නමින් හැඳින්වෙන දෙවියන්ගේ කෝවිල ගම්මානයෙන් පිටත පූජනීය තුරුවදුලක පිහිටා ඇති බවත්, ගෞරවය නිසා එහි ගසක කොළයක් කැඩීමට පවා මිනිසුන් බිය වන බවත් පෙන්වා දී තිබේ (ඕමැලි 1935:141-143). දේවස්ථානයේ අශ්ව රූප පෙළක් තනා ඇති බවත්, ගමේ ආරක්ෂක දේවතාවා වන ඔහු තම පිරිවර සමග ඒ අසුන් මත නැගී ගම වටා රාත්‍රී කාලයේ සංචාරය කරන බවත් විශ්වාස කෙරේ (වයිට්හෙඩ් 1921:33). මෙම රූප දැව ශිලා සුණු සහ ගඩොළුවලින් නිර්මාණය කරනු ලබන අතර ඇතැම් රූප අඩි 20 පමණ උස්වන බවත් ඔහුගේ සහායක යක්ෂ රූප ඊට මදක් කුඩාවට තනා ඇති බවත් දක්නට ලැබේ. ඇතැම් විට ඔහුගේ බිසෝවරුන් දෙදෙනාගේ රූප අයියනාර් රූපයට දෙපසින් තනා ඇති අතර සහායක යක්ෂයන්ගේ රූප ද බිහිසුණු ලක්ෂණ සහිත ව ඒ අසල ම තනා තිබේ (ඕමැලි 1935:141-143) නමුත් ශ්‍රී ලංකාවේ දෙමළ භාෂාව කථාකරන ජනතාව දකුණු ඉන්දීය අයියනාර් චින්තනය එහැම පිටින් ම උපුටාගෙන ඒ අනුගමනය කරන බවක් නොපෙනේ. ඔවුන්ගේ පිළිගැනීම් හා සිංහල භාෂාව කථාකරන ජනතාවගේ පිළිගැනීම් බොහෝ අවස්ථාවල දී එක සමාන ස්වරූපයක් ගනී.

වයඹ පලාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටි වේලාසිය නමින් හඳුන්වන ස්ථානය අයියනායක දෙවියන් නැවතී සිටි මුල් ම භූමිය බව සඳහන් වේ. එම වේලාසිය උයන්වත්තේ තිබූ දේවාල මන්දිරය සිංහල දේව වර්ණනා කාව්‍යවල අතිශයෝක්තියෙන් විස්තර වේ. ශිලාමය පවුරකින් වට වූ එම දේවාල ගෘහය, ගල් ගඩොළුවලින් බැඳී බිත්ති සහ උළුවසු සහිත වූ බවත් කොන්ත චාමර සහිත දේවාලයේ පියස්ස (දිසානායක 2000:210;1996:81) උළු සෙවිලි කළ ඉතා අලංකාර

එකක් වූ බවත් කියැවේ. ඒ ආකාරයට ම පුත්තලමේ තිබූ දේවාල මන්දිරයක් ද දේව වර්ණනා කාව්‍යවල විස්තර කෙරේ. මේ අධ්‍යයනය හා සම්බන්ධ ගවේෂණ කටයුතුවල දී පැහැදිලි වූයේ ඉහත කී වර්ණනා කාව්‍යවල සඳහන් වන ආකාරයේ දේවාල මන්දිර හෝ උද්‍යාන සහිත දේවාල මන්දිර කිසිවක් (ඒවායේ නටබුන් හෝ) ඒ තැන්වල දක්නට නොලැබුණු බවයි. අයියනායක නමින් සිංහල භාෂාව කථාකරන ජනතාවගෙන් වැඳුම්පිදුම් ලබන දෙවියන්ගේ දේවාල, ගැමි පරිසරයට ගැලපෙන ආකාරයෙන් තැනූ ඉතාමත් චාම්, සරළ ඒවා විය.

ප්‍රකට අයියනායක දේවාල පිහිටා ඇති මුන්නේශ්වරම, මරදන්කුලම, සිද්ධමඩම, ළිඳවැව, දැදුරු ඔය වැනි ස්ථානවල විසිතුරු දේවාල සංකීර්ණ නූතනයේ තනා ඇතත්, ඒවා පැරණි චාම් දේවාල ගෘහයන් බිඳ දමා මෑතක දී අලුතින් නිර්මාණය කළ ඒවා බව පැහැදිලි විය. දැදුරු ඔය අයියනායක දේවාලයේ පැරණි ගොඩනැගිල්ල ඉතා කුඩා එකක් විය. ඒ කුඩා ගොඩනැගිල්ල ඉදිරිපසින් මණ්ඩපයක් ද දෙපසින් ශාලා දෙකක් ද තවත් ගබඩා කාමරයක් ද අලුතින් එක් වී දේවාලය නවීකරණය වූයේ උදාගම් ව්‍යාපාරය යටතේ 1983 වර්ෂයේ දී ය.

අයියනා දෙවියන් අදහන ස්ථාන මූලික වශයෙන් දේවාල මන්දිර සහ දේව සංහිඳ යැයි කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය. දේව සංහිඳ යනු බොහෝ විට කිසිදු ගෘහයක් දක්නට නැති පැරණි ගසක් යට පිහිටි පූජනීය ස්ථානයකි. පලු ගස, වීර ගස, නුග ගස, බෝ ගස, කොන් ගස, කොහොඹ ගස, සියඹලා ගස, සහ කුඹුක් ගස යන වෘක්ෂයන්ගේ සෙවන යට පිහිටා තිබූ දේව සංහිඳ නැමැති පූජනීය ස්ථාන ගණනාවක් දැකගන්නට ලැබුණි. එයිනුදු වීර ගස, අයියනායක දෙවියන්ට ම වෙන් වූ විශේෂ වෘක්ෂය ලෙස සැලකේ. එහෙයින් දේව සංහිඳ ලෙස සැලකුණු ස්ථාන වැඩි ගණනාවක් පිහිටා තිබුණේ වීර ගස් යට ය. මීඔය, මුරුක්වටවණ, තම්මැන්නාවැටිය, අතුරුපොලයාගම, මීයැල්ලැව, කිරිමැටියාව, නවගත්තේගම, මොරගහවැව, රත්කිරාගම, කෝන්කල්ල, රඹකනයාගම, ගල්කුලම, සෙල්ලන්කන්ද, කිවුල වැනි තැන්වල දේව සංහිඳ ලෙස සැලකෙන වෘක්ෂයන් දක්නට ලැබුණි. මේ දේව සංහිඳේ පූජාසනය ලෙස සැලකුණේ බොහෝ විට කලු ගලකි. නැතිනම් ගල් කුට්ටියකි. ඒ නැතිනම් වැස්සට තෙමී දිරාපත් වෙමින් පවත්නා ලෑල්ලකි. ඇතැම් තැනක දී එම ලෑල්ල ගල් දෙකක් යටින් තබා පොළොවේ සිට අඩියක් පමණ උඩට ඔසවා තිබෙනු පෙනුණි. බොහෝ තැන්වල එම ලෑල්ල බිම තැබූවක් විය. කළු ගල් පුවරුවක් ගෙන ඒ යටින් ගල් තබා එම පුවරුව මඳක් ඔසවා පූජාසනය ලෙස සකසා ගෙන තිබූ තැන් ද සිමෙන්ති හා හුණු බදාම යොදා සරළ ලෙස තැනූ පූජාසනයක් ද ඇතැම් ගස් යට මෑතක දී නිර්මාණය කර තිබුණි. ගල් ගුහා අයියනායක දේවාල බවට පත් කරගත් අවස්ථා කිසිදු තැනකදී දැක ගන්නට නොලැබුණි.

දේව වර්ණනා කාව්‍යවල කුමක් සඳහන් වුවත්, අයියනා දෙවියන්ගේ මුල් ම වාසස්ථානය මෙන් ම දේව අනුහස් තදින් ම පැතිර පවතින තැනක් ලෙස විශ්වාස කරන වේලාසිය තවමත් පැරණි සම්ප්‍රදාය අනුව කිසිදු ගොඩනැගිල්ලක් නොමැති ව දේව සංහිඳක ආකාරයෙන් පවතින බව ගවේෂණ කටයුතුවල දී දැකගත හැකි විය. මෙතැන ශුද්ධ පවිත්‍ර කිරීමේ අපේක්ෂාවෙන් වුවත් ගස්වැල් කපා දැමීමට දෙවියන් අකමැති වන බව ප්‍රදේශවාසීන්ගේ පිළිගැනීමයි. වනයට සහ වන සතුන්ට අධිපති අයියනා දෙවියන් වනයත් වනසතුනුත් ආරක්ෂා කරන බවත්, ගස්වැල් කපා දැමීම අනුමත නොකරන බවත් ගැමියෝ තදින් ම ප්‍රකාශ කර සිටිති. ප්‍රකට තබ්බෝවේ වැව අසල ඇති අයියනා දේවාල භූමියේ කැලෑව ශුද්ධ පවිත්‍ර කරවීම සඳහා වරෙක පුත්තලම මහ දිසාපතිවරයා සේවක පිරිසක් එහි යැවීය. එහෙත් ගැමියන් ඊට විරුද්ධ ව ඒ පිරිස ආපසු හරවා යවා, දිසාපතිතුමා හමුවී එසේ නොකරන ලෙස කරුණු පැහැදිලි කළ බව අසන්නට ලැබුණි.

අතීතයේ තැණූ පැරණි දේවාල ගෘහ ඇතත් ඒවා කටුමැටි බිත්ති සහ තල් අතු, පිදුරු හෝ පොල් අතු සෙවිලි කළ පියසි සහිත ඉතාමත් සරල ඒවා ය. නූතන සංකල්ප අනුව මෑතක දී ඇතැම් දේවාල පියසි උළු හෝ බෙලෙක් තහඩු යොදා නවීකරණය කර තිබෙන බව දැකගන්නට ලැබුණි. දේවාල ගෘහය බොහෝ විට තනි කාමරයක් විය. නිල් හෝ රතු තිරයක් යොදා එය කොටස් දෙකකට බෙදා තිරයෙන් ඇතුළු පැත්ත පූජාසනය සහිත දෙවියන් වැඩ සිටින ගර්භ ගෘහය ලෙස ප්‍රයෝජනයට ගන්නා බව පෙනුණි. මීඔය දේවාලය, කරුවලගස්වැව දේවාලය, ආත්තිකුලම දේවාලය වැනි තැන් ඊට උදාහරණය. ඇතැම් අයියනායක දේවාලවල දෙවියන් සහ මිනිසුන් අතර සම්බන්ධය ඇති කරන අතර මැදි පුද්ගලයෙකු (භාරකරුවෙකු හො කපුවෙකු) දක්නට නොලැබුණි. මීට හොඳ ම උදාහරණය ප්‍රකට තබ්බෝව වැව අසල ඇති මහ දේවාලයයි. වේලාසියේ කපුවකු තබා දේවාලයක් වත් දක්නට නැත. නිකවැරටිය දැදුරුඔය මහ දේවාලයේ ද කපුවකු නොසිටි අතර මෑතක දී සිදු වූ නවීකරණයන්ගෙන් පසුව එබඳු කෙනෙකු එහි රාජකාරියට යොදවා සිටින බව පෙනේ. ඕනෑම ගැමියෙකුට තමන්ගේ ''දැනුම් තේරුම්කම්'' අනුව තමන්ගේ වචනවලින් සෘජුව ම දෙවියන් ඉදිරියේ තම දුක්ගැනවිල්ල නැත්නම් කන්නලව්ව ඉදිරිපත් කළ හැකි වීම මෙම දෙවියන්ගේ විශේෂත්වය වේ.

දේව සංහිඳ සහ දේවාල ගෘහ වැඩි ප්‍රමාණයක පූජා භාණ්ඩ ලෙස භාවිත කරන විශේෂ ද්‍රව්‍ය හෝ පඬුරු ලෙස මුදල් දමන පෙට්ටි දක්නට නොලැබුණි. අසල ඇති ගසකින් කඩාගත් කොළ අතු කැබැල්ලක් ගස් දෙබලක නැතිනම් දේවාලය ඉදිපිට බැඳ ඇති වැලක එල්ලා තම දුක් ගැනවිල්ල දෙවියන්ට ඉදිරිපත් කිරීම හැම අතින් ම ප්‍රමාණවත් වන බව ගැමියන්ගේ පිළිගැනීම විය. නූතනයේ

ඇතැම් මහා මාර්ග අසල මෙබඳු කොළ අතු එල්ලා ඇති දේවාල සහ දේව සංහිඳ දක්නට ලැබේ. එහෙත් ඇතැම් තැනක පැරණි සිරිත අනුව කොළ අතු එල්ලන අතර ම නූතන සංකල්ප අනුව පිං පෙට්ටියකට පඬුරු දැමීමට ද අවකාශ සලසා ඇති බව දැකගත හැකි විය. මෙසේ පඬුරු දමන තැන්වල බොහෝ විට එය බලා ගන්නා කපුවකු පූසාරිකෙනෙකු හෝ භාරකරුවෙකු සිටින බව ද පෙනුණි. මල්, පහන්, බුලත්, කපුරු, හඳුන්කූරු, හඳුන්කල්ක, සක්ගෙඩි සහ තවත් නොයෙක් දේව ආභරණ ලෙස සැළකෙන විවිධ ලෝහමය භාණ්ඩ ඇතැම් දේවාල ගෘහයන් ඇතුළත පූජාභාණ්ඩ ලෙස පූජාසනය මත තැන්පත් කර තිබුණි. දෙවියන්ට අයත් භාණ්ඩ අතර කැත්ත, හෙල්ල, ත්‍රිශූලය, කඩුව, සැරයටිය, අත්වළලු, පූනාව, රන්කෙණ්ඩිය ආදිය ඒ අතර දක්නට ලැබුණි.

මෙයට අවුරුදු විසිපහකට පමණ පෙර උතුරු මැද සහ වයඹ පලාතේ ජනතාව අතර දක්නට ලැබුණු තත්වය නම් මෙම දෙවියන්ට පුද පූජා තබන ගැමියන් අතර කතෝලික අය සහ ස්ලාම් භක්තික අය ද සුලභ ව දක්නට ලැබුණු බවයි. නමුත් මූලධර්මවාදී අදහස් ඉස්මතු වීම නිසා මේ වන විට ඒ තත්වය බොහෝ දුරට අඩුවී ඇති බවක් පැහැදිලි වේ. අයියනායක දෙවියන් උදෙසා විසිතුරු පුදපූජා ඇතැම් අය වර්තමානයේ පවත්වනු ලැබුවත්, මෙම දෙවියන් අඟුරු, දුම්මල, කොඩිවැල්, පුළුටු, ගොටු, පිදේනි, අපෙක්ෂා නොකරන වනයේ ගසක කොල අත්තක් කඩා එල්ලා තම දුක්ගැනවිල්ල ප්‍රකාශ කළ පමණින් මිනිසුන්ට පිහිටවන ඉතා ම කාරුණික කෙනෙකු බව පැරණි ගැමියන්ගේ පිළිගැනීම විය. වර්තමානයේ මෙම දෙවියන් සහ මිනිසුන් අතර නියෝජිතයන් බිහිවී බොහෝ නවීකරණය වූ දේවාල 1970 දශකයෙන් පසුව ඒ තත්වයට පත් වූ ඒවා ය.

අයියනා දෙවියන්ට කොළ අතු එල්ලීමට නූතන සමාජයේ වැඩිදෙනා එතරම් කැමැත්තක් නොදක්වන බව විවිධ අය සමඟ කළ කථාබහේ දී දැනගන්නට ලැබුණි. කොළ අතු එල්ලීම, තමන්ගේ දුප්පත්කම පෙන්වන සාධකයක් යැයි සිතන ඇතැම් අය එයින් වැලකී සිටින බවත්, ඒ නිසාම පිං කැටයක් නැති විශේෂයෙන් දේව සංහිඳ පිහිටි ගස් යටට යන මිනිසුන් ඒ ගසේ මුලට හෝ එහි ඇති පූජාසනය මතට මුදල් (කාසි) දමා යන බවක් දකින්නට ලැබුණි. හලාවත සිද්ධමඩල අයියනා දේවාලයේ වසර සියගණනක් පැරණි කුහරයක් සහිත විශාල පලු ගසක් දක්නට තිබේ. මෑතක දී තැනූ දේවාලය හා පින්පෙට්ටිය පසෙක තිබිය දී සම්ප්‍රදායික ව සිතන ඇතැම් ගැමියන් තවමත් ඒ අසල කොළ අතු එල්ලන බවත් ඒ ගසේ කුහරය තුළට පඬුරු දමා යන බවත් දේවාලයේ පූජකතුමා ප්‍රකාශ කළේ ය. මුල් ම අවධියේ හලාවත සිද්ධමඩම දේවාලයක් නොතිබුණු අතර ඒ වෙනුවට මෙම පලුගස යට දෙවියන් සඳහා කරන පුදපූජා සහ යාදිනි පවත්වනු ලැබූ බවක්

අසන්නට ලැබුණි. එහෙත් පසු කාලීන ව මිනිසුන්ගේ ආකල්ප වෙනස්වීමත් සමඟ මෙම දෙවියන් සඳහා මෙතැන ද දේවාලයක් ඉදි කරන්නට මිනිසුන් කටයුතු කර තිබේ.

සමහර පූජනීය ස්ථානවල කිසියම් බැතිමතකු හිතුමතේ ගොඩනැගිලි ඉදිකළොත් දෙවියන්ගේ අලි ඇතුන් වනයේ සිට පැමිණ ඒවා කඩා බිඳ දමා යන බව ගැමියෝ ප්‍රකාශ කරති. ඒ නිසා පරම පූජනීය ස්ථානයක් වූ වේලාසියේ වැව් කණ්ඩිය අයිනේ ඇති ගසක් යට ගොක් අතු වලින් තැනූ සරල පහන් පැලක මේ දෙවියන් උදෙසා පවත්වන උසස් ම පුදපූජා කවමත් පැවැත්වෙන බව දැගන්නට ලැබේ. එබඳු ම පූජනීය ස්ථානයක් ලෙස සැලකෙන තබ්බෝවේ දේවාලය පලුගස් වීරගස්වලට මැදි වූ වැව් කණ්ඩිය අයිනේ පිහිටි එම ගස්වලින් සෙවන වූ එලිමහන් තැනකි. එතන තබ්බෝව වැව ප්‍රතිසංස්කරණය කළ පසුව මෑතක දී දේවාල ගෘහයක් සුළුවෙන් තනා තිබෙනු පෙනේ. එහෙත් පිං පෙට්ටියක් හෝ කපුවෙකු එහි තවමත් දක්නට නොලැබේ.

වයඹ පළාතේ ජනතාව අතර දැනට දක්නට නැතත්, උතුරු මැද පළාතේ තවමත් මෙම දෙවියන් සඳහා පවත්වන පුදපූජා අතර ඉතා උත්කර්ශවත් ස්වභාවයක් ගනු ලබන්නේ මුට්ටි මංගල්ලය බව පැවසේ (චන්ද්‍රජෝති හිමි සහ විපුලසාර හිමි 1956:36) ඇතැම් ගම්වල වාර්ෂික ව ද ඇතැම් ගම්වල වසර දෙකතුනකට හෝ පහකට වරක් ද මෙම උත්සවය තවමත් පැවැත්වෙන බව පෙනේ. ගමේ කුඹුරු සහ හේන්වල කටයුතු ආරම්භ කිරීමට පෙර ගම් වැසියෝ කෙම්මුර දිනයක වැව් කණ්ඩිය මතට රැස්වී දෙවියන්ට කන්නලව් කිරීමෙන් පසු ව මුට්ටි නැමීමේ කාර්යය සිදු කරති. එනම් ගස් දෙබලක මුට්ටිය යට අතට මුව සිටින සේ හරවා රඳවා තැබීමයි. අස්වනු කපාගත් පසුව නියම කරගත් දිනයක දෙවියන්ට වූ භාරය අනුව මුට්ටි මංගල්ලය පවත්වනු ලැබේ. එය දින දෙකක් පමණ පුරා පැවැත්වෙන විසිතුරු බවක් ගන්නා උත්සවයකි. බත්, මාළුපිණි මෙන් ම රස කැවිලි හා පළතුරු යනාදියෙන් ද ගමේ හැමදෙනාටත් එහි පැමිණ සිටින හැම දෙනාටත් මෙම උත්සවයේ දී සංග්‍රහ කරනු ලැබේ (දිසානායක 1996:56-68; දලුපොත 2003:52-55; මානැව 2004:153-165). ඒ හැරුණු විට වයඹ පළාතේ ඇතැම් දේවාලවල වාර්ෂික ව ඇසළ මස පවත්වන අංකෙළිය හා පොල් කෙළිය ද අයියනා දෙවියන් හා සම්බන්ධ කොට පැවැත්වෙන තවත් එබඳු ම උත්සව දෙකක් වේ. නිකවැරටිය දැදුරු ඔය අයියනායක දේවාල මංගල්ලයේ දී පැවැත්වුණු අං කෙළියේ දී එක් අඟක් අයියනා දෙවියන් ද අනෙක් අඟ පත්තිණි දෙවියන් ද නියෝජනය කෙරිණි. එහි ම පොල් කෙළියේ දී එක් පිළික් අයියනා දෙවියන්ගේ පිල ලෙසත් අනෙක් පිල පත්තිණි දෙවියන්ගේ පිල ලෙසත් නම් විය.

සිංහල බෞද්ධ ජනතාව අතර පවතින විශ්වාසය අනුව සතුන් මරා පවත්වන බිලිපූජා අයියනායක දෙවියන් උදෙසා කිසිදු අවස්ථාවක කරනු ලබන බවක් අසන්නට නොලැබේ. ඒ තත්වය ම දකුණු ඉන්දියාවේ අයියනාර් දෙවියන් සම්බන්ධයෙන් ද දක්නට ලැබෙන බව පෙනේ (වයිට්හෙඩ් 1921:18). ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ තිබෙන අයියනාර් කෝවිල්වල ද සතුන් මරා පුදපූජා පැවැත්වීමක් සිදු නොවේ. එහෙත් චුන්නාකම්හි ඇති පහත් කුලවල ජනතාවට අයත් අයියනාර් කෝවිලක වාර්ෂික උත්සවය පැවැත්වෙන මාර්තු අප්‍රේල් මාසවල දී එළුවන් සියගණනක් මරා අයියනාර්ට පුදපූජා පවත්වනු ලැබූ බව ජේම්ස් කාර්ට්මන් (1957:73) වාර්තා කර තිබේ.

**දෙවියන්ගේ ප්‍රභවය**

මෙම දෙවියන්ගේ උපත සිදුවූ ආකාරය විවිධ මූලාශ්‍රයවල විවිධාකාරයෙන් සටහන් වේ. එම උපත පිළිබඳ පුරාවෘත්ත හින්දු ආගමේ ශිව හා විෂ්ණු යන ප්‍රධාන දෙවිවරුන් දෙදෙනා හා සම්බන්ධ ය. ශිව දෙවියන් විසින් මවන ලද දෙවියෙකි, යනුවෙන් එක් අදහසකුත් විෂ්ණු දෙවියන් විසින් මවන ලද දෙවියෙකි. යනුවෙන් තවත් අදහසකුත් වේ. (කරුණාතිලක 1984:131) මෙහි දී විෂ්ණු රූමත් ස්ත්‍රියකගේ (මෝහිණියගේ) වෙසින් සිටි බව (ඔබේසේකර 1984:113-114) ප්‍රකට ය. ශිව හා විෂ්ණු දෙදෙනා ම එක්වී මවන ලදි. නැතිනම් උපත සිදුකරන ලදි, යනු තවත් මතයක් වේ. මීළඟට පාර්වතී විසින් මවන ලදි, යනු තවත් මතයකි. කන්‍යාවියකගේ කුසෙහි ඉපදුණි යන්නත්, රාම කුමරු කුසින් ඉපදුණි, යන්නත් තවත් තැන්වල සඳහන් වේ (කාරියවසම් 1991:4-5). සත් අල්ලෙන් උපන් බව තවත් තැනක කියයි (දිසානායක 1996:18; 2000:210). උපුල්වන් සුරිදුගේ බලයෙන් තම මවගේ දකුණු ළය පළාගෙන උපන් අයකු ලෙස තවත් කාව්‍යයක ඔහුගේ උපත සටහන් වී තිබේ.

විෂ්ණු දෙවියන්ගේ අවතාරයක් ලෙස ද ඇතැම් තැනක මේ දෙවියන් හඳුන්වා ඇත (පාකර් 1984:160). අයියනායක යනු වෙනත් කිසිවකු නොව ගණ දෙවි නොහොත් පුල්ලෙයාර් නමින් හඳුන්වනු ලබන දෙවියන් ම යැයි විශ්වාස කරන අය ද සිටිති (හියු නෙවිල් 1955:227). අයියනායක මලල කුමාරවරුන් සමඟ නැව් නැගී මේ දිවයිනට පැමිණි මලලවරුන්ගේ දෙවියෙකු බව කඩඉම් හා විත්ති පොත් අවධාරණය කරයි (අභයවර්ධන 1998:21; අභයසිංහ 1960:107). ඒ අනුව මෙම දෙවියන්ගේ උපත සිදුවූ ස්ථානය මලල රට බව බොහෝ දුරට අනුමාන කළ හැකි ය. එනම් ජාවා සුමාත්‍රා දූපත්වලින් සැදුණු ශ්‍රී විජය අධිරාජ්‍යයයි. මදුරාපුරය සහ ඇතැම් විටක මදුරාසිය ද මෙම දෙවියන්ගේ මුල් භූමිය බව වෙනත් මූලාශ්‍රයන්හි විස්තර වේ (සෝමානන්ද හිමි 1993:7; දිසානායක 1996:80). ඇතැම් විටක එය මයුරපුරය ලෙස ද සඳහන් වේ (කාරියවසම් 1991:4-5). ඒ අතර තවත්

තැනක මල්ලව රට (දිසානායක 2000:210) මෙන් ම මල්වරා දේශය (සෝමානන්ද හිමි 1993:6) ද ඔහුගේ ජන්ම භූමිය වූ බව කියැවේ.

ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ වන්නි හත්පත්තුවේ ඇතැම් ගම්වල ජීවත් වන ජනතාව තමන් ජීවත් වන්නේ අයියනා බණ්ඩාර දෙවියන්ගේ නින්දගමේ බවත්, ඔහු තම මුත්තණු කෙනෙකු බවත් ප්‍රකාශ කරති. අයියනා මුත්තා, අයියනා මුත්තාගේ නින්දගම, අයියනා මුත්තාට ම පෙනියං, අයියනා මුත්තාගේ පිහිටයි වැනි යෙදුම් ඔවුන්ගේ බස් වහරෙහි අසන්නට ලැබේ (ජයතිලක සහ සේනානායක 1987).

අයියනාර් නමින් දකුණු ඉන්දියාවේ ගම්බද ප්‍රදේශවල වන්දනයට පාත්‍රවන දෙවියන් හින්දු ආගමට කිසිදු සම්බන්ධයක් නැති ප්‍රාග් බ්‍රාහ්මණ දෙවියෙකු බව ඕමැලි කියයි. බ්‍රාහ්මණයෝ දකුණු ඉන්දියාවේ ජනප්‍රිය ව සිටි ඉපැරණි ගෝත්‍රික දෙවිවරු හින්දු ආගමේ පුළුල් වටරවුම ඇතුළට ඇද ගත්හ. ඉන් පසුව ඔහු හින්දු දෙවිකෙනෙකු ලෙස නම් කළහ. මේ අනුව ඉතා ජනප්‍රිය ග්‍රාමීය දෙවියෙකු වූ අයියනාර්ට මිථ්‍යා කථාවක් මගින් ශිව හා පාර්වතී දෙවියන්ගේ පුතකු ලෙස ඉතා උසස් ඥාතීත්වයක් සපයා දෙනු ලැබූ බව ඕමැලි තව දුරටත් විස්තර කරයි (1935:143-144). මේ තත්වය ම ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන බව පැහැදිලි ය. දෙමළ භාෂාව කථාකරන ශ්‍රී ලංකාවේ ජනතාව ශිව හා පාර්වතී දෙදෙනාගේ පුත්‍රයකු ලෙස අයියනායක පිළිගනී. සිංහල භාෂාව කථාකරන ජනතාව ද ඒ අදහස පිළිගන්නා අතර ම ඊට තවත් ඌනපූර්ණයක් සපයති. එනම් බුදුන් වහන්සේට පමණක් දෙවැනි වන මතු බුදු වන බෝධිසත්වරයකු ලෙස ඔහු හඳුනාගැනීම ය. මතු බුදු බව ලබන දෙවිවරු තත්වයෙන් ඉතා උසස් වෙති. වයඹ පළාතේ වසන සිංහල බෞද්ධයෝ අයියනායක දෙවියන් එබඳු උසස් ම තත්වයේ දෙවියෙකු ලෙස අන් දෙවිවරු අතරින් ඉහළට ඔසවා තබති. ශ්‍රී ලංකාවේ සිටි අතීත ජනතාව බුදු දහම වැළඳගත් පසු තමන් ප්‍රාග් බෞද්ධ යුගයේ ඇදහූ ඇතැම් දෙවිවරු මිථ්‍යාදෘෂ්ටිකත්වයෙන් මුදවා මේ අයුරින් ම බෞද්ධ දෙවිවරුන් බවට පත්කර ගත් බව වල්පොල රාහුල හිමි විසින් (1960:45) ද පෙන්වා දී තිබේ.

අයියනායක දෙවියන්, කඩවර, කම්බිලි, සූනියම් ආදී පහත් ගණයේ දෙවිවරු අතරට පත් නොවූ විෂ්ණු, කතරගම, සමන්, නාථ, පත්තිනි, ආදී උසස් ගණයේ දෙවිවරු අතර සමතැන් ගන්නා (එක යහනේ කෙළි පිදේනි ලබන්නට වරම් ඇති) දෙවියකු ලෙස දේව යාදිනිවල විස්තර වේ. මෙම පුරාවෘත්ත අයියනා දෙවියන්ගේ තත්වය උසස් කිරීම සඳහා පසු කාලීන ව සකස් කළ ඒවා වීමට බොහෝ දුරට ඉඩකඩ තිබේ. පහත් ගණයේ දෙවිවරුන්ට පුදපූජා තබන ආකාරයට ගොටු දීම් අයියනා දෙවියන් සඳහා ද කළ බව පියසේන කහඳගමගේ කියයි. ඉතා

පැරනි අතීතයක සිට පැවත එන රජරට වැව් බැඳීම හා සම්බන්ධ වත්පිළිවෙත්වල දී අයියනායක දෙවියන් සඳහා ගොටු දීම කළ බව ඔහු (1997:16) වාර්තා කරයි. මෙම ගොටු දීමේ චාරිත්‍රය අයියනායක තත්වයෙන් උසස් වීමට පෙර ආරම්භ වූ පැරණි ගෝත්‍රික පුදපූජා විධි සිහිපත් කරවයි. අයියනායක දෙවියන් බුදුන් වහන්සේගෙන් වරම් ලබාගත් දෙවියකු බවත්, පන්දහස් කල් බුදු සසුන ආරක්ෂා කිරීම අයියනා දෙවියන්ට භාර වූ බවත්, මේ අතර සමහර දේව වර්ණනා කාව්‍යවල සඳහන් වේ (කාරියවසම් 1991:4-5). සිංහල බෞද්ධ දේව සමූහයා පිළිබඳ ව විග්‍රහයක් කළ ගනනාථ ඔබේසේකර බුදුන් වහන්සේට පහළින් සතරවරම් දෙවිවරු සිටින බවත් ඊට පහළින් අනෙකුත් ප්‍රධාන දෙවිවරුන් සිටින බවත් ඊට යටින් ප්‍රාදේශීය දෙවිවරුන් සිටින බවත් දෙවිවරුන්ගේ තලයට පහළින් යක්ෂයන්ගේ තලය පවතින බවත් මෙය ඉහළ සිට පහළට විහිදෙන පිරමීඩාකාර සැලැස්මක් බවත් වැඩිදුරටත් විග්‍රහ කළේ ය (1963:136). ඒ අනුව අයියනායක දෙවියන් සතරවරම් දෙවිවරුන්ගෙන් එක් අයකු බව, එනම් බුදුන් වහන්සේට ඉතාමත් සමීපතම තලයෙහි සිටින දෙවියකු බවට පත්කරන්නට ගත් උත්සාහයක් ද සමහර දේව වර්ණනා කාව්‍යවල දක්නට ලැබේ.

නමුත් මලල කුමාරවරු සමග ඔවුන්ගේ දෙවියකු ලෙස පැමිණි අයියනායක ඒ වන විට මේ රටේ ප්‍රබල ව සිටි දෙවිවරුන් සමග ගැටී මෙරටට ගොඩ බැසීමට මලලවරුන්ට අවස්ථාව ලබා දුන් බව වන්නි උපතෙහි පැහැදිලි ව ම සඳහන් වේ (අභයසිංහ 1960:108). ක්‍රිස්තු වර්ෂ 14 වන සියවසින් පසුව ලියැවුණු කඩඉම් පොත් සහ විත්ති පොත් අයියනා බණ්ඩාර ගැනත් ඔහුගේ දේවස්ථාන තිබූ ප්‍රදේශ පිළිබඳ වත් යම් යම් අවිධිමත් තොරතුරු සපයයි (මාරඹේ 1962:29).

### අයියනායක දෙවියන්ගේ අනුගාමිකයෝ

දකුණු ඉන්දියාවේ අයියනාර් දේව වන්දනය පිළිබඳ මතවාද අනුව ඔහුගේ අනුගාමිකයන් වන්නේ කුට්ටිසාත්තන්, සාත්තන්, මුණ්ඩන්, කරුප්පන් සහ ගුලිකන් යන පස්දෙනා ය. මොවුහු භයානක යක්ෂයන් ලෙස විස්තර වේ (වයිට්හෙඩ් 1935:141). නමුත් ශ්‍රී ලංකාවේ දේවතා පස්දෙනාගේ කවිවල සඳහන් වන්නේ ඔවුන් අයියනා දෙවියන් සමග මෙහි ආ ඔහුගේ සේවකයන් බවයි (කාරියවසම් 1991:139). ඉළන්දාරි දෙවි, කම්බිලී දෙවි, කළු දේවතා, කඩවර සහ ගුරුමා යන පස්දෙනා (දිසානායක 1996:26). දේවතා පස්දෙනා ලෙස බොහෝ විට හඳුනා ගැනේ. කළුකුමාර බණ්ඩාර, ඉලංගසිංහ බණ්ඩාර, දිවාකර බණ්ඩාර, රාජකරුණා බණ්ඩාර,වනවිරාජ බණ්ඩාර යන බණ්ඩාරවරුන් පස්දෙනා අයියනා දෙවියන් සමග ශ්‍රී ලංකාවට පැමිණි අය බව (අභයසිංහ 1960:170) ඇතැම් කඩඉම් හා විත්ති පොත් ප්‍රකාශ කරයි. පනික්කි බණ්ඩාර කළු දේවතා දෙදෙනා ද අයියනායකගේ අනුගාමිකයන් බව ඇතැම් මල්යහන් කවිවල සඳහන් වේ (කරුණාතිලක 1985:132).

හැන්දෑකඩවර නොහොත් වැදියක් කංකාරිය නම් ශාන්ති කර්මයේ දී කඩවර, ගම්බාර සහ අයියනායක යන තිදෙනාට ගොටු දීම සිදු වේ. මෙහි දී ගොක් අත්තක් මත කඩවර ගොටුව පිදෙන අතර අයියනායකට ගොටුව පිදෙන්නේ (පහත් දෙවිකෙනෙකුට පුදන ආකාරයෙන්) ඇවරි කණුවක් මත බව කියැවේ (දිසානායක 1996:73-74) අයියනායකගේ සේවකයෙකු බව කියන කඩවරට (වාචිස්සර හිමි 1964: 94-95; හෝල්ට් 1994:316) උසස් පිළිගැනීමක් ද ස්වාමියා බව කියන අයියනායකට පහත් සැලකිල්ලක් ද ලැබීම විමසා බැලිය යුතු කරුණකි. හැන්දෑ කඩවර නොහොත් වැදියක් කංකාරිය පැරණි ගෝත්‍රික ලක්ෂණ ප්‍රකට කෙරෙන ප්‍රාථමික ශාන්තිකර්මයක ස්වරූපය ගනී. මෙය අයියනායක, ශිව හා පාර්වතීගේ පුතකු බවටත් මතු බුදු වන බෝසත්වරයකු බවටත් තත්වයෙන් උසස් කිරීමට පෙර පැවති එම දෙවියන්ගේ පැරණි ස්වභාවය විය හැකි ය. දඩයම හා පළමුල් එක්රැස් කිරීමේ ජීවන රටාවට හුරු පුරුදු වී සිටි ප්‍රාග් ඓතිහාසික මිනිසා යකඩ සොයා ගැනීමෙන් පසුව ක්‍රමයෙන් කෘෂි ආර්ථික ජීවන රටාව හුරුපුරුදු වූ බව පැවසේ. (සෙනවිරත්න 1984:279-293) ගොවිතැන් කරන සමාජයක් තුළ එම කටයුතුවලට ආරක්ෂාව ලබාදෙන දෙවිවරු ඉතා වැදගත් වේ. ඒ නිසා පැරණි දඩයම් යුගයේ සිටි දෙවිවරුන්ගේ තත්වය පහළ ගොස් ගොවිතැන් කටයුතුවලටත් ගව මහිෂාදීන්ටත් ආරක්ෂාව ලබාදෙන අයියනායක වැනි දෙවි කෙනෙකු ඉස්මතුවීම ස්වභාවික ය.

වනගත ප්‍රදේශයට අධිපති වන්නියේ ප්‍රධානතම දෙවියා අයියනායක ය. ශ්‍රී ලංකාවේ උතුරු මැද සහ නැගෙනහිර ප්‍රදේශය පුල්ලෙයාර් දෙවියන්ට භාරවී පවත්නා අතර බටහිර සහ වයඹ ප්‍රදේශය අයියනායක දෙවියන්ට භාරවී ඇති බව ඇතැම් පුරාවෘත්ත අනුව පැහැදිලි වේ (සේනානායක 1993:26). අයියනා දෙවියන් සම්බන්ධ පුරාවෘත්ත විධිමත් ව පරීක්ෂා කළ විට ඔහු යම් කාලයක දී මලල කුමාරවරුන් සමග පැමිණි, වයඹ පළාතේ පදිංචි වූ ප්‍රභුවරයකු බව ද අනුමාන කළ හැකි ය. එසේ පදිංචි වූ අයියනා දෙවියන් යකුන් ලවා තබ්බෝවේ වැව බඳවා පුත්තලම් ප්‍රදේශයේ කෘෂි ආර්ථික කටයුතුවලට පවා සේවයක් ඉටු කළ බවට තොරතුරු ඇතැම් පුරාවෘත්ත අනාවරණය කරයි (සේනානායක 1993:26). මෙම දෙවියෝ හැඩි දෙමළ කල්ලි බිඳ දැමූ බවත්, දෙමළ යකුන්ට බැට දී පන්නා දැමූ බවත්, පරංගීන්ට බැට දුන් බවත්, ලන්දේසීන්ගේ නැව් කප්පරවල් පොඩිකර දැමූ බවත්, ඊට අමතර ව හෙට්ටි, මරක්කල, මුක්කර, ජා, මලයාල, කන්නඩ සහ ආඩි යන ජන පිරිස්වලට තම තෙද බල පෙන්වූ බවත් ඇතැම් දේව වර්ණනා කාව්‍යවල විස්තර වේ. එයින් පැහැදිලි වන්නේ මෙම දෙවියන් ප්‍රථමයෙන් ම කෘෂි ආර්ථිකය සරුසාර කිරීමට උපකාර කළ දෙවි කෙනෙකු ලෙස හැඳින්වුවත්, දෙවනුව පරසතුරු ආක්‍රමණ බහුල වූ අවස්ථාවල දී යුද්ධයට අධිපති දෙවිකෙනෙකු ලෙස ඔහුට වෙනත් අනන්‍යතාවක් ආරෝපණය කිරීමට උත්සාහ ගෙන ඇති බවයි.

## සමාලෝචනය

කාලය විසින් පරිසරය හා මනුෂ්‍ය සමාජය බොහෝ වෙනස්වීම් වලට පරිවර්තනය කරනු ලැබීම ස්වභාවයකි. විද්‍යාත්මක දියුණුව ඇතිවීමත් විවෘත ආර්ථික ක්‍රමයට ශ්‍රී ලංකාව හැඩගැසීමත් නිසා පසුගිය වසර තිහක පමණ කාලපරිච්ඡේදය තුළ සාම්ප්‍රදායික ගැමි ජීවිතයත්, පැරණි කෘෂි ආර්ථිකයත් නොයෙකුත් විපර්යාසයන්ට භාජනය විය. බෝවන රෝග හා වෙනත් ලෙඩදුක් අසනීප ආදිය ඇති වූ විටත් කෘෂි භූමිවල පලිබෝධ හා වගාහානි සිදුවූ විටත්, දෙවියන්ගේ පිහිට ඉල්ලා දේවාලවලට යාමට වඩා විද්‍යාත්මක ප්‍රතිකර්ම කෙරෙහි විශ්වාසය තබා ඒ අනුව කටයුතු කිරීමට මේ ප්‍රදේශවල ජනතාව ක්‍රමක්‍රමයෙන් පුරුදු පුහුණු වූහ. එය යහපත් සමාජ පරිවර්තනයක් ලෙස අගය කළ හැකි ය. එහෙත් ඒ නිසා මෙම දේවාලවල පැවැත්මට පමණක් නොව ගැමි සමාජයේ පැවැත්මට ද සිදුවෙමින් පවත්නා හාණිය සුළුපටු නොවේ. එදා ආගම් භේද, ජාති භේද, භාෂා භේද, නොසලකා එක ම ජන පිරිසක් ලෙස ඒකරාශී වී පුදපූජා පැවැත්වූ වැඩි දෙනා අද තම තමන්ගේ ආගම්වල මූලධර්මවාදී සංකල්ප තුළ හුදකලා වෙමින් සිටිනා බවක් පෙනේ. පිරිසිදු බෞද්ධ දර්ශනය දේව ඇදහිලි ප්‍රතික්ෂේප කරයි. පිරිසිදු හින්දු දර්ශනය ද බෞද්ධ ඇදහීම් අනුමත නොකරයි. මූලධර්මවාදී ඉස්ලාම් භක්තිය සෙසු සියළු ඇදහිලි ක්‍රම පිටුදකී. අයියනායක හෝ අයියනාර් දෙවියන් ඇදහීමේ පැරණි සම්ප්‍රදාය තුළ මේ ආගම් තුනේ ම ජන පිරිස් ඒකරාශී වී සිටිය හ. ඒ සියලු ම දෙනා ආගම් භේදයකින් තොර ව මෙම දෙවියන්ගේ පිළිසරණ පැතු හ. ඒ නිසා විද්‍යාත්මක දියුණුව හා සමාජ පරිවර්තනය අනුමත කරන අතර ම මෙබඳු දේව ඇදහිලි ක්‍රම හා බැඳී පැවතුණු සාමය සමගිය හා සාමූහිකත්වය වැනි සාරධර්ම ආරක්ෂා කර ගැනීම සඳහා විකල්ප වැඩපිළිවෙලක අවශ්‍යතාවය අවධාරණය කරමු.

## විමර්ෂණ ග්‍රන්ථ නාමාවලිය


අබේරත්න. ඒ.එම්.එච්.ආර්. (1986), ශාන්ති කර්ම ආශ්‍රිත ජන ගායනා, *අපේ ජනකලා*, කොළඹ, පළාත්පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය, පිටු 207-210.

අයිවර්ස්. ආර්.ඩබ්ලිව්. (1899), *Mannual of the North Central Province*, Colombo Government printer,

අභයවර්ධන එච්.ඒ.පී. (1978), කඩඉම් පොත් විමර්ශනය, කොළඹ සංස්කෘතික දෙපාර්තමේන්තුව,

එඩ්මන්ඩ් කේ.බී.ඒ. (1993), අයියනායක දේව සංකල්පය, *සාහිත්‍ය විශේෂ කලාපය 93*, කොළඹ, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය. සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, පිටු අංක 97-105

ඔබේසේකර, ගනනාථ (1963), The Buddhist pantheon and Its Extensions, *Anthropological studies in Theravada Buddhism*, New Haven, Yale University Press.

ඔබේසේකර, ගනනාථ (1984), *The cult of Goddes pattini,* Chicago, Chicago University Press.

ඔමැලි, එල්.එස්.එස්. (1935), *Popular Hinduisum*, The Religion of the Madras, Cambridge, Cambridge University Press.

කරුණාතිලක, ඇන්.ටී. (1985), දැදුරු ඔය බඩ ජන ඇදහීම්, කොළඹ, එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳමගේ, පියසේන. (1997), කෙතක මහිම, කුඹුර, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ.

කාර්ට්මන්, ජේම්ස්. (1957), Hinduism in Ceylon, Colombo, M.D. Gunasena and Company Limited.

ගුණවර්ධන, ඩබ්ලිව්.එෆ්. (1945), වර්ණනා සහිත කෝකිල සංදේශය, කොළඹ, එම්.එච්.එෆ්. ජයසූරිය ප්‍රකාශනය.

ජයතිලක, කේ.එච්. සහ පියතිස්ස සේනානායක, (1987) පලුගොල්ල ප්‍රදේශය පිළිබඳ පුරාවිද්‍යා ගවේෂණයක්, පර්යේෂණ පත්‍රිකාව, දේශීය පුරාවිද්‍යා සමුළුව 1987, කොළඹ, ශ්‍රී ලංකා පදනම් ආයතනය.

දළුපොත, මහින්ද කුමාර (2003), *මුට්ටි මංගල්ලයේ වගතුග,* කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක මුදියන්සේ (1996), *වන්නියේ දෙවි දේවතා සම්භවය සහ ව්‍යාප්තිය,* කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ (2000), *චින කැපුම් යාග විග්‍රහය,* කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මබන්ධු, ටී. ඇස්. (1962), *සිංහල මහා ආකරාදිය,* කොළඹ, සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

නවරත්නම්, සී.එස්. (1964), *A short History of Hinduism in Ceylon,* Jaffna, Sri Sanmuganatha Press.

පරණවිතාන, සෙනරත් (1986), උතුරුකරයේ ආර්ය රාජ්‍යය, The Arya kingdom in NorthCeylon 1961 ලිපියේ සිංහල අනුවාදය, අභය ආර්යසිංහ, නුගේගොඩ, ජනකාන්ත ප්‍රකාශන භාරය.

පාකර්, හෙන්රි (1984), *Ancient Ceylon,* Bombay, Reprint by Asian Educational service.

පීරිස්, රල්ප්, (1964), *සිංහල සමාජ සංවිධානය,* කොළඹ, සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

මානෑව, කේ.බී. (2004), *නුවර කලාවියේ ජන මංගල්ල.* කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මාරඹේ, ඒ.ජේ.ඩබ්ලිව්. (1926), *ශ්‍රී සිංහලේ කඩඉම් හා විත්ති,* මහනුවර, ලංකාප්‍රදීප යන්ත්‍රාලය.

මුදියන්සේ, නන්දසේන (1989), දක්ෂිණ භාරතීය සබඳතා ඇති ලාංකික දෙවිවරු,*විද්‍යෝදය, 3 කලාපය,* නුගේගොඩ, විද්‍යෝදය විශ්ව විද්‍යාලය, පිටු අංක 125 - 131.

වයිට්හෙඩ්, එච්.ඩී.ඩී. (1921), *The village Goods of South India*, London, oxford University press.

නවිස්සර හිමි, කොටගම. (1964), *සරණංකර සංඝරාජ සමය,* කොළඹ, වයි. දොන් ඇඩ්වින් සහ සමාගම.

සේනානායක, පියතිස්ස. (1993), *වයඹ පළාතේ සංස්කෘතික දායාද,* කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සේනානායක, පියතිස්ස. (2002), The belief in the Deity Ayiyana in Sri Lanka, paher presented at the *Peradeniya University Research Sessions*, PURSE 2003, October 23rd 2003, Faculty of Medicine, Peradeniya, University of Peradeniya.

සේනානායක පියතිස්ස (2008), පලුගොල්ලේ අයියනා පත්තිනි දේවාලය, *පැහැසර,* මහාචාර්ය පී.බී.මීගස්කුඹුර උපහාර ලිපි සංග්‍රහය, සංස්කාරවරු ලක්ෂ්මන් නුගපිටිය, මංගල කේශව දිසානායක සහ මහින්ද රත්නායක, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටු 40-65.